දක්ෂිණ මාර්ග සම්බන්ධ කෙරෙන ව්‍යාපෘතිය - 2021
-----------------------------------------------------

දක්ෂිණ මාර්ග සම්බන්ධ කෙරෙන ව්‍යාපෘතියේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ආසියානු සංවර්ධන බැංකුව අතර 2014 මැයි 27 දින එළඹි අංක 3027 එස්ආර්අයි දරන ණය ගිවිසුමේ II ව්‍යවස්ථාවේ 2.09 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත වාර්තා කළ යුතු යැයි සැලකෙන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය
------------------------------------------------------------

ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව, එවකට වරාය හා මහාමාර්ග අමාත්‍යාංශය වර්තමානයේ මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. දක්ෂිණ අධිවේගී මාර්ගයට සම්බන්ධ කිලෝ මීටර් 33ක් වැඩි දියුණු කිරීම හා ප්‍රතිසංස්කරණය කිරීම තුළින් ජාතික ප්‍රවාහනයේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම ව්‍යාපෘතියේ අරමුණු වේ. ණය ගිවිසුමට අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 12,248කට සමාන එජඩො මිලියන 95ක් වන අතර ඉන් රු.මිලියන 9,025කට සමාන එජඩො මිලියන 70ක් සැපයීමට ආසියානු සංවර්ධන බැංකුව එකඟ වී තිබුණි. ඉතිරි වටිනාකම වන රු. මිලියන 3,223කට සමාන එජඩො මිලියන 25ක් සැපයීමට ශ්‍රී ලංකා රජය එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2014 මැයි 27 දින ආරම්භ කරන ලද අතර 2018 දෙසැම්බර් 30 දින වන විට නිම කිරීමට නියමිත විය. කෙසේවෙතත්, ව්‍යාපෘතියේ කටයුතු නිමකිරීමේ දිනය 2021 දෙසැම්බර් 31 තෙක් දීර්ඝ කර තිබුණි.

1.3 තත්ත්වාගණනය කළ මතය
---------------------------

මාගේ වාර්තාවේ 2.1 වගුවේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
---------------------------------------

මම මාගේ විගණනය ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන් වලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුව සිදු කරන ලදි. මෙම ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මාගේ වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ යෝග්‍ය බව මාගේ විශ්වාසයයි.

1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම
------------------------------------------------------------------------------------------

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන් වලට අනුකූලව පිළියෙල කිරීම, සත්‍ය හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම පිළිබඳ වගකීම ඊට සම්බන්ධ පාර්ශවය විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හෝ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා හෝ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීමෙන් හා ක්‍රියාත්මක කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ යෝග්‍ය විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදු කරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මඟින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද මුත් අභ්‍යන්තර පාලනයේ සඵලත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- හෙළිදරව් කිරීම් ඇතුළත්ව මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

මාගේ විගණනයේදී මා හඳුනාගත් අභ්‍යන්තර පාලනයේ සැලකියයුතු අඩුපාඩු ද ඇතුළුව සැලකියයුතු විගණන සොයාගැනීම් හා අනෙකුත් කරුණු සම්බන්ධයෙන් ඊට සම්බන්ධ පාර්ශවයන් සමඟ මම සන්නිවේදනය කරමි.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| ගිණුම්කරණ අඩුපාඩු | මුදල රු. මිලියන | කළමනාකරණයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| 2021 දෙසැම්බර් 31 දිනට ඉඩම් හිමිකරුවන් වෙත රු. මිලියන 205ක ව්‍යවස්ථාපිත වන්දි නිරවුල් කිරීමේ ප්‍රමාදය සඳහා ගෙවිය යුතු රු. මිලියන 68ක (ආසන්න වශයෙන්) පොළිය සඳහා වෙන්කිරීම් කර නොතිබුණි. | 68 | මූල්‍ය ප්‍රකාශනවල සටහන් යටතේ අනාවරණය කර ඇත. | මූල්‍ය ප්‍රකාශනවල 2021 දෙසැම්බර් 31 දිනට දක්වා ඇති රු. මිලියන 205ක ගෙවිය යුතු වන්දි සම්බන්ධයෙන් රු. මිලියන 68ක පොළිය හඳුනාගෙන වාර්තා කිරීම අවශ්‍ය වේ. |

### 2.2 නීති, රීති රෙගුලාසිවලට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | කළමනාකරණයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 8.13.4 වගන්තිය | කොන්ත්‍රාත් පැකේජ - 02 මුළු පිරිවැය රු. මිලයන 3,064ක් වූ අතර අවිනිශ්චිත වෙන්කිරීම් සඳහා මුළු කොන්ත්‍රාත් වටිනාකමින් රු. මිලියන 510ක් හෙවත් සියයට 20ක් වෙන්කර තිබුණි. 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයට අනුව කොන්ත්‍රාත් වටිනාකම ඉක්මවීමට අවශ්‍ය අනුමැතිය ලබා ගත යුතුය. කෙසේවෙතත්, මුළු කොන්ත්‍රාත් වටිනාකමින් රු. මිලියන 1,573 හෙවත් සියයට 51 එවැනි අනුමැතියකින් තොරව වියදම් කර තිබුණි. | PMU විසින් අදාළ නිර්දේශයන් සඳහා TEC, PPC අනුමැති සහ ADB එකඟතාවයට ලබාගෙන ඇත. | සංශෝධිත මුළු පිරිවැය ඇස්තමේන්තුව අනුව නියමිත TEC මඟින් සහය දෙන ලද සුදුසු PC මඟින් විචල්‍යතා අනුමත කළ යුතුය. |

## 3. භෞතික කාර්යසාධනය

### 3.1 ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳ භෞතික ප්‍රගතිය

| සංරචකය | 2021 දෙසැම්බර් 31 දිනට | | විගණන ගැටලුව | ප්‍රමාදය සඳහා හේතු |
|---|---|---|---|---|
| | අපේක්ෂිත භෞතික කාර්යසාධනය | අත්කරගත් කාර්යසාධනය | | |
| | ප්‍රතිශය | ප්‍රතිශය | | |
| කොන්ත්‍රාත් පැකේජ 05 | මුල් වැඩසටහන - 100<br>සංශෝධිත වැඩසටහන - 84 | 59<br>78 | ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳ සත්‍ය ප්‍රගතිය අපේක්ෂිත ප්‍රගතියට පිටුපසින් පැවතුණි. | කොවිඩ්-19 වසංගත තත්ත්වය |

**කළමනාකරණයේ ප්‍රතිචාරය** — කොවිඩ් 19 වසංගතය හැර ඉඩම් අත්පත් කරගැනීමේ ප්‍රමාදය, උපයෝගිතා මාරු කිරීමේ ප්‍රමාදයන් හා විෂය පථය වෙනස් වීම් කොන්ත්‍රාත් පැකේජ 05 භෞතික ප්‍රගතිය ප්‍රමාද වීමට ප්‍රධාන වශයෙන් හේතු විය.

**විගණකගේ නිර්දේශය** — ප්‍රමාදය නිසා සිදුවන අමතර පිරිවැය වළක්වාගැනීමට සහ මහජනතාවට සිදුවන අපහසුතාවයන් වළක්වාගැනීමට මාර්ග පුනරුත්ථාපන කටයුතු ඉලක්කගත දිනයන්ට නිම කිරීමට කඩිනම් පියවර ගැනීම අවශ්‍ය වේ.

### 3.2 කොන්ත්‍රාත් පරිපාලනය

| | විගණන ගැටලු | කළමනාකරණයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | කොළඹ සහ කළුතර දිස්ත්‍රික්කවල ජාතික මාර්ගවල කිලෝමීටර 40.2ක් නැවත ඉදිකිරීම් සඳහා වන කොන්ත්‍රාත් පැකේජ 01, 02, 04 සහ 05 ඉදිකිරීම් කටයුතු සැලකිය යුතු ප්‍රමාදයකින් පසුව නිම කර තිබුණි. ඒ අනුව 2017 ජූනි 19 දින කොන්ත්‍රාත් පැකේජ 01න් ප්‍රමාද ගාස්තු රු. මිලියන 31.95ක් අයකර තිබුණු 2019 ඔක්තෝබර් 10 දින කොන්ත්‍රාත්කරු වෙත නිදහස් කර තිබුණි. ඊට අමතරව පැකේජ 04 මත පනවන ලද ප්‍රමාද ගාස්තු රු. මිලියන 14.18ක් 2021 දෙසැම්බර් 31 දිනට කොන්ත්‍රාත්කරු වෙත නිදහස් කළ යුතු වගකීමක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | එකඟ වේ. ඉඩම් අත්පත් කර ගැනීමේ ප්‍රමාදයන්, උපයෝගිතා මාරු කිරීමේ ප්‍රමාදයන් සහ විෂය පථය වෙනස්වීම නිසා ප්‍රධාන වශයෙන් ඉහත කොන්ත්‍රාත් පැකේජවල කොන්ත්‍රාත් පැකේජ 01,02,04 සහ 05 ප්‍රමාදයන් සහිතව නිම කර තිබුණි. මෙවැනි තත්ත්වයන් පාලනයට කොන්ත්‍රාත්කරුට නොහැකි වූ අතර එමනිසා සාධාරණ කාලය දීර්ඝ කිරීම් ලබා දීමට සිදුවිය. පැකේජ 04 කොන්ත්‍රාත්කරුගෙන් අඩුකර ගන්නා ලද ප්‍රමාද ගාස්තු රු. මිලියන 14.18ක් කාලය දීර්ඝ කිරීම් අනුමත කරන තෙක් වගකීමක් ලෙස වාර්තා කර තිබුණි. | ඉලක්කගත දිනයන්ට මාර්ග පුනරුත්ථාපන කටයුතු නිම කිරීමට පියවර ගත යුතුය. |
| (ආ) | ලැබී තිබුණු තොරතුරු අනුව, මුල් කොන්ත්‍රාත් වටිනාකම ඉක්මවා මුළු කොන්ත්‍රාත් පිරිවැය ඉක්මවීම | එකඟ වේ. ඉදිකිරීම් සිදු කරමින් පවතින විට සමහර ප්‍රායෝගික අවශ්‍යතා විෂය පථය වෙනස් වීමට | කොන්ත්‍රාත් ගිවිසුම ප්‍රකාරව පොළී පිරිවැය ඉවත් කිරීමට |

| | | | |
|---|---|---|---|
| | හේතුවෙන් අන්තර් ගෙවීම් සහතික අංක 29 යටතේ 2019 ජූනි 24 දින කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කරන ලද අවසාන ගෙවීම සම්බන්ධ එකතුව රු. මිලියන 248.6ක් ණය නියෝජිතායතනය විසින් නිරවුල් කර නොතිබුණි. එමනිසා මෙම මුදල 2021 දෙසැම්බර් 31 දින වන විටත් වර්ෂ 2 ½ තිස්සේ ගෙවිය යුතු වගකීමක් ලෙස පැවතුණි. එහි ප්‍රතිඵලයක් ලෙස කොන්ත්‍රාත්කරු ප්‍රමාද කාලය සඳහා පොළිය ලෙස රු. මිලියන 46.9ක් ඉල්ලා තිබුණු අතර එමගින් 2021 දෙසැම්බර් 31 දිනට මුළු නිරවුල් නොකළ ශේෂය රු. මිලියන 310.6ක් දක්වා වැඩිවී තිබුණි. | හේතු වේ. එමනිසා මේ සම්බන්ධයෙන් කොන්ත්‍රාත් මුදල සංශෝධනය කිරීමට සිදුවිය. කොන්ත්‍රාත්කරු සමග අන්‍යෝන්‍ය අවබෝධය සමග සංශෝධිත කොන්ත්‍රාත් මුදලට යටත්ව ඉහත අවශ්‍යතා කොන්ත්‍රාත් කාලපරිච්ඡේදය ඉක්මවීමට පෙර සම්පූර්ණ කළ යුතුය. | කොන්ත්‍රාත්කරුගේ වගකීම් නිරවුල් කිරීමට අවශ්‍ය වේ. |
| (ඇ) | ව්‍යාපෘතියේ කටයුතුවල මන්දගාමී ප්‍රගතිය හේතුවෙන්, ව්‍යාපෘතියේ වැය විෂය අංක 117-2-4-43-2506-17 මුළු ප්‍රාග්ධන වියදමින් සියයට 95ක් නියෝජනය කරන රු. මිලියන 200.21ක් ශ්‍රී ලංකා රජයේ ප්‍රතිපාදන සහ මුළු විදේශ ණයවලින් සියයට 14ක් නියෝජනය කරන රු. මිලියන 286ක ප්‍රතිපාදන සමාලෝචිත වර්ෂය තුළදී උපයෝජනය කර නොතිබුණි. | එකඟ වේ. කොන්ත්‍රාත් බිල් නිරවුල් කිරීමට වැය විෂය අංක 2-4-43-2056-17 සඳහා රු. මිලියන 200ක අමතර ප්‍රතිපාදන අනුමත කර තිබුණි. නමුත් කාලය සීමා කිරීම් නිසා එය ක්‍රියාත්මක නොවුණි. 2021 දී කොවිඩ්- 19 බලපෑම සමඟ ව්‍යාපෘතියේ මන්දගාමී ප්‍රගතිය හේතුවෙන් විදේශ ප්‍රතිපාදනවල ඌන උපයෝජන (14%) වාර්තා කර තිබුණි. | ණය පහසුකම ඉකුත්වීමට පෙර මුළු ණය ප්‍රමාණය උපයෝජනයට ව්‍යාපෘතියේ ඉදිකිරීමේ කටයුතු නිසි පරිදි ක්‍රියාත්මක කළ යුතුය. |

**3.3** ඉඩම් අත්පත් කර ගැනීම සම්බන්ධ ගැටලු

| විගණන ගැටලු | කළමනාකරණයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|
| ලැබී ඇති තොරතුරු අනුව, රජයට අයත් ඉඩම් කැබලි 1,562ක් ඇතුලුව ඉඩම් කැබලි 8,499ක් අත්පත් කර ගැනීමට සැලසුම් කර තිබුණු අතර ඉන් ඉඩම් අත්පත්කර ගැනීමේ පනතේ 17 වගන්තිය යටතේ රු. මිලියන 8,418ක වන්දි මුදලක් ගෙවා තිබුණි. තවද ඉඩම් අත්පත්කර ගැනීමේ හා නැවත පදිංචි කිරීමේ කමිටුවේ තීරණය යටතේ රු. මිලියන 3,210ක අමතර ගෙවීමක් සිදුකර තිබුණි. ඊට අමතරව 2021 දෙසැම්බර් 31 දිනට දක්වා වන්දි ගෙවීම ප්‍රමාද වීම මත පොළී වශයෙන් එකතුව රු. මිලියන 649ක් ගෙවා තිබුණි. කෙසේවෙතත්, 2021 දෙසැම්බර් 31 දිනට ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 44 වන වගන්තිය යටතේ කිසිදු ඉඩමක් ලියාපදිංචි කර ගෙන නොතිබුණි. | එකඟ වේ. අරමුදල් පවතින ප්‍රමාණය මත ඉතිරි ඉඩම් කොටස් සඳහා වන්දි ගෙවීමේ ක්‍රියාවලිය සිදු කරමින් පවතී. 2021 අවසානයේ පොළී ගෙවීම සිදු කර ඇති අතර ඉඩම් අත්පත්කර ගැනීමේ පනතේ 44 වගන්තිය යටතේ ලියාපදිංචි කිරීමට පෙර අත්පත්කර ගත් ඉඩම් සඳහා හිඟහිටි පොළී ගෙවීම සම්පූර්ණයෙන්ම නිරවුල් කළ යුතු වේ. | වන්දි ගෙවීමේ කඩිනම් කිරීමට පියවර ගත යුතු අතර මා. සං. අ. වෙත ඉඩම්වල හිමිකාරිත්වය මාරු කිරීමට කටයුතු කළ යුතුය |